# පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය.

**අභියාචනා අංක:- AAT/70/2025 (NPC)**

එම්.ටී.එම්.ටී.ප්‍රසාද්
**අභියාචක**

**එදිරිව,**

ජාතික පොලිස් කොමිෂන් සභාව
**වගඋත්තරකරු**

**දිනය : 2026.05.21**

| | | |
|---|---|---|
| **ඉදිරියේ දී** | **විනිසුරු කේ.ටී.චිත්‍රසිරි** | **(සභාපති)** |
| | **ජේ.ජේ.රත්නසිරි** | **(සාමාජික)** |
| | **එස්.නන්දසේකරන්** | **(සාමාජික)** |

පෙනී සිටීම :- අභියාචක සිටී.
අභියාචක වෙනුවෙන් විශ්‍රාමික රජයේ සේවක තිස්ස ගුණතිලක මහතා.
වගඋත්තරකාර ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් නියෝජ්‍ය අධ්‍යක්ෂ මාලා බස්නායක මහත්මිය.

**-නියෝගය-**

මෙම අභියාචනය සම්බන්ධයෙන් වන කරුණු විමසීමෙන් අනතුරුව, ජාතික පොලිස් කොමිෂන් සභාව වෙනුවෙන් පෙනීසිටින මාලා බස්නායක මහත්මිය දන්වා සිටින්නේ, මෙම අභියාචක නැවත සේවයේ පිහිටුවීමට අදාළව ඉදිරිපත් කරන ලද පොලිස්පතිතුමාගේ නිර්දේශය ලබා දී ඇත්තේ, අභියාචනය ඉදිරිපත් කර ඇති කාලපරිච්ඡේදය පමණක් සළකා බැලීමෙන් පසුව බවයි. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් 2026.05.11 දිනැතිව ඉදිරිපත් කරන ලද වාර්තාවේ ix ඡේදයේ සඳහන් කර ඇත්තේ, අභියාචක නැවත සේවයේ පිහිටුවීමට පොලිස්පති විසින් නිර්දේශ කර ඇති වුවද වෙනත් නිළධාරීන්ගේ මෙවැනි සිදුවීම් සම්බන්ධයෙන් පොලිස්පති විසින් නිර්දේශ ලබා දී ඇති හෙයින් සහ අභියාචක විසින් ඉදිරිපත් කර තිබූ අභියාචනයට අවසර නොදීම සඳහා වෙනත් සුවිශේෂ කරුණු ඉදිරිපත් කර නොතිබූ බවට ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් නිරීක්ෂණය කරන ලද බවයි.

අභියාචක සේවයට වාර්තා නොකර ඇත්තේ, හුදෙක්ම විදේශගත වීම හේතුවෙනි. විදේශගත වීමට පෙර අභියාචක විසින් ඒ සඳහා නිවාඩු අයදුම්පතක්ද ඉදිරිපත් කර ඇත. අභියාචක 2024.11.08 දින නැවත මෙරටට පැමිණීමෙන් අනතුරුව මාසයක පමණ කාලයක් තුළ නැවත සේවය සඳහා වන ඉල්ලීමද කර ඇත. අභියාචක අපරාධ විද්‍යා ඩිප්ලෝමාවක්ද හදාරා ඇත.

ඉහත කී කරුණු සළකා බැලීමෙන් පසු, විශේෂයෙන්ම පහත සඳහන් කොන්දේසිවලට යටත්ව අභියාචක නැවත සේවයේ පිහිටුවන ලෙසට නියෝග කරමු. ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඉදිරිපත් කර ඇති 2026.05.11 දිනැති වාර්තාවේ ix වන ඡේදයේ සඳහන් කරුණු අනුව මේ හා සමාන අවස්ථාවන්හිදී පොලිස්පති විසින් නැවත සේවය ලබා දීමට නිර්දේශ කර තිබෙන බවට ඇති සඳහන පිළිබඳව සළකා බලා මෙම නියෝගය ප්‍රකාශයට පත් කරන ලදී.

මෙම කරුණු සළකා බලා, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අභියාචක නැවත සේවයේ පිහිටුවන ලෙස ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත නියම කරමු.

*a. අවසන් වරට පසුබිම් වාර්තාවක් ලබා ගත් 2025.10.30 දිනෙන් පසු කාලයට අදාලව පසුබිම් වාර්තාවක් ලබා ගැනීම.*

*b. නැවත පොලිස් රාජකාරී සඳහා සුදුසු මානසික හා ශාරීරික සෞඛ්‍යකින් යුතුව සිටිදැයි පරීක්ෂා කිරීමට වෛද්‍ය වාර්තාවක් ලබා ගැනීම.*

*c. විෂ මත්ද්‍රව්‍ය ලබා ගෙන ඇද්ද යන්න තහවුරු කර ගැනීමට නිලධාරියාගේ වියදමින් මුත්‍රා පරීක්ෂණයක් සිදු කිරීම.*

*d. ධාරිතා සංවර්ධන පුහුණු පාඨමාලාවකට යොමු කිරීම.*

*e. සේවයේ නොසිටි කාලය වැටුප් රහිත සේවා කාලයක් ලෙස සැලකීම. (සේවයේ නොසිටි කාලයට අදාල කිසිදු අවස්ථාවකදී උසස් වීම් හෝ හිඟ වැටුප් ඉල්ලීමකට හිමිකම් නොමැත.)*

*f. වසරක කාලයක් සඳහා වැඩ හා හැසිරීම් ගොනුවක් ආරම්භ කර පවත්වාගෙන යාම*

*g. අනවසරයෙන් විදේශගතවීමට අදාලව සුදුසු දඬුවමකට යටත් කිරීම.*

ඉහත කොන්දේසිවලට යටත්ව, අභියාචක විසින් ඉදිරිපත් කර ඇති අභියාචනයට අවසර දීමට තීරණය කරමු.

කොන්දේසිවලට යටත්ව අභියාචනයට අවසර දෙමු.

විනිසුරු කේ.ටී.චිත්‍රසිරි
(සභාපති)

මම එකඟ වෙමි.

ජේ.ජේ.රත්නසිරි
(සාමාජික)

මම එකඟ වෙමි.

එස්.නන්දසේකරන්
(සාමාජික)

දෙව්මිනි/